**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2024.11.25 |
|---|---|---|

පැමිණිලිකරු - අවලා සෙනෙවිරත්න මෙය,
අංක - 215, කනත්ත පාර,
පන්නිපිටිය.

වගඋත්තරකරුවන් -
01. ප්‍ර.පො.ප චින්තක අනුරාධ මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, වැලිකඩ.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

__පැමිණිලි අංක - HRC/HO/792/24__

__පැමිණිල්ලේ කරුණු දැක්වීම__

- 2023.12.04 වන දින ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධයැයි කියනු ලබන අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය නමින් හඳුන්වන සංවිධානය විසින් පොල්දූව වටරවුමේ පාර්ලිමේන්තු මාර්ගය ආසන්නයේ සිදුකළ විරෝධතාවය පිළිබඳව වැලිකඩ පොලිස් ස්ථානාධිපතිතුමා විසින් කොළඹ 04 අධිකරණයට 463/04/2023 යටතේ බී වාර්තාවක් මගින් කරුණු වාර්තා කර ඇති බවත්,

- ඉහත නඩු අංකය යටතේ 2024.01.22 දින වැලිකඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන 01 වන වගඋත්තරකරු කරුණු වාර්තා කරමින් ඉහත අපරාධමය ක්‍රියාව සහ විරෝධතාව සංවිධානය කරන ලද හා එහි ක්‍රියාකාරි සාමාජිකයෙක් වූ බවට සඳහන් කරමින් අවලා සෙනෙවිරත්න නමින් 07 වන සැකකරු ලෙස තමාගේ නම ඇතුළත් කර ඇති බවත්,




| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

- එහිදී අධිකරණයට කරුණු වාර්තා කර ඇත්තේ උද්ඝෝෂණය සිදුකිරීම මගින් නීති විරෝධී රැස්වීමක සාමාජිකයින් වෙමින් පොදු දේපල වන මාර්ග සංවර්ධන අධිකාරියේ දේපල වලට අනර්ථයක් කිරීමත්, මාර්ගයෙන් ගමන් කළ මගීන් දෙදෙනෙකුට අයුතු අවහිර කිරීමත්, පොදු දේපල විෂයෙහිලා සිදුකරන වැරදි ලෙස පිළිගැනෙන 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 02 වන වගන්තිය යටතේ වු කරුණු පිළිබඳව බවත්,

- මේ පිළිබඳව තමාගේ මිතුරියක වන හා එහි 04 වන සැකකරු ලෙස නම් කර ඇති නිතිඥ ධනුෂිකි ලියනපටබැදි තමාට දන්වා වට්ස්අප් මාර්ගයෙන් අදාළ ලේඛන ලබාදුන් බවත් ඒ අනුව තමා දැනුවත් වූ බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී.

- මෙම සිද්ධියට අදාළව ද්වේශ සහගත ලෙස පැමිණිලිකාරියගේ නම ඇතුලත් කර තමා අත්අඩංගුවට ගැනීමට ප්‍රබල උපායක වගඋත්තරකාර පාර්ශවය නිරත වන තමාට පෙනී ගිය බවත් වැඩිදුරටත් දන්වා ඇත.

- 2023.12.04 වන දිනයෙහි තමා තමාගේ සාමාන්‍ය වෘත්තිය කටයුතු වල නියැලෙමින් කොළඹ අලුත් කඩේ උසාවි සංකිර්ණයේ රැදී සිටි බවත්, කිසිදු උද්ඝෝෂණයකට සහභාගි නොවූ බවත් වැඩිදුරටත් දන්වා සිටියි.

- එවැනි තත්ත්වයක් තිබියදී තමා හට අහේතුක ලෙස මෙන්ම ද්වේශ සහගත ලෙස තමාගේ ජීවිතයට හා වෘත්තිය ජීවිතයට හානි කිරීමට හා තමාගේ එදිනෙදා කටයුතු අඩාල කරමින් තමාව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගතහොත් තමාගේ මූලික අයිතිවාසිකම් කඩ වීමක් වන බවත්, එලෙස අත්‍යාසන්න ලෙස තමාව අත්අඩංගුවට ගැනීමේ හැකියාව ඇති බැවින් තමා අභියාචනාධිකරණයට යොමු වී (CA/Writ/187/2024) අත්අඩංගුවට නොගැනීමට අතුරු නියෝගයක් ලබාගත් බවත් දක්වා ඇත.

- තවද, පැමිණිලිකාරිය දක්වා සිටින්නේ මීට පෙර අවස්ථා දෙකකදී කොළඹ කොටුව පොලිසිය මගින්ද බී 222759/22 යටතේ මේ ආකාරයට තමාගේ නමින් අධිකරණයට කරුණු වාර්තා කර තමාට නඩු කටයුත්තකට සහභාගිවීමට සිදුවු බවයි. මේ අවස්ථාවේදී ද එවැනි ආකාරයෙන් වගඋත්තරකාර පාර්ශවය අත්තනෝමතිකව ක්‍රියාත්මක වී තමාව අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් තිබුණු බැවින් තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට අත්‍යාසන්න අවස්ථාවක් වු බවත් වැඩිදුරටත් දක්වා සිටියි.

- තවද, තමා මේ සම්බන්ධව 2024.02.26 දාතමින් 02 වන වගඋත්තරකරු වන පොලිස්පති වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළද ඒ සම්බන්ධව කිසිදු විමර්ශනයක් නොවූ බවත් දක්වා සිටියි.

**01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම**

2023.12.04 වන දින වැලිකඩ පොලිස් වසමේ පොල්දූව මංසන්දිය ආශ්‍රිතව පවත්වන ලද ජනතා විමුක්ති පෙරමුණට අයත් යැයි සැලකෙන අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය විසින් සංවිධානය කරන ලද විරෝධතා ව්‍යාපාරයකට අදාළව සිදුකළ නීතිවිරෝධි ක්‍රියා සම්බන්ධව අලුත්කඩේ මා/උ බි 5463/04/23 නඩුවට අදාළ වැඩිදුර වාර්තාවේ සැකකරුවන් 08 දෙනෙකු නම් කර ඇති බවත්, එහි වුදිත 07 ලෙස නම් කර ඇත්තේ අවලා සෙනෙවිරත්න යන නමින් මිස අවලා ශානිකා සෙනෙවිරත්න යන නමින් හෝ ඇයගේ පදිංචි ලිපිනය වූ අංක 215, කහවත්ත පාර, ඇලන්වත්ත, පන්නිපිටිය යන ලිපිනයේ සඳහන් සැකකරුවෙකු සම්බන්ධයෙන් වැඩිදුර වාර්තාවේ සඳහන් කර නොමැති බැවින් පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන චෝදනා සියල්ල තමා ප්‍රතික්ෂේප කරන බවත් 2024.04.09 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාවේදි පැවැති පරීක්ෂණයේදි දන්වා සිටින ලදී.

තවද 01 වන වගඋත්තරකරු 2024.04.09 දිනැති කොමිෂන් සභා පරීක්ෂණයේදී X නමින් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලද ඡායාරූපයේ සිටින කාන්තාව ඉහත සිද්ධියට අදාළ තමා සොයන සැකකාරිය වන අවලා සෙනෙවිරත්න යන වග දන්වා සිටියි.

මීට පෙර උද්ඝෝෂණවල ද ඉහත සඳහන් කළ ඡායාරූපයේ සිටි කාන්තාව සහභාගි වී ඇති බවත්, තමාගේ මතකයේ හැටියට අවලා සෙනෙවිරත්න යන නමින් සිටින්නේ ඇය බවත්, මීට පෙර කිසිදු අවස්ථාවක ඡායාරූපයේ සිටින කාන්තාව සම්බන්ධයෙන් නීති විරෝධි උද්ඝෝෂණ සඳහා කරුණු වාර්තා කර නොමැති බවද දක්වා ඇත. තවද මේ සම්බන්ධව තවදුරටත් විමර්ශන කටයුතු සිදුකරන බවත් දක්වා සිටියි.

**විමර්ශනය**

පැමිණිලිකාරිය මූලිකවම කොමිෂන් සභාවට පැමිණිලි කරමින් දන්වා සිටිනුයේ තමා උද්ඝෝෂණයකට සහභාගි වි පොදු දේපලවලට හානි කළ බවට කිසිදු විමර්ශනයකින් තොරව, සාධාරණ හේතුවකින් තොරව සැකකරුවෙකු ලෙස අධිකරණයට කරුණු වාර්තා කර ඇති බවත් ඒ තුළින් තමාව අනීතිකව අත්අඩංගුවට ගැනීමට අත්‍යාසන්න බවත් ය.

මෙහිදි 01 වන වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ 2023.12.04 වන දින පොල්දූව වටරවුමේ පැවැති උද්ඝෝෂණයකට අදාලව අධිකරණයට කරුණු වාර්තා කළ බවත්, එහිදි අදාල වීඩියෝ පට අධික්ෂණය කර සැකකාරියන් හඳුනා ගත් බවත්ය.

01 වන වගඋත්තරකරු 2024.04.09 දින මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදි දන්වා සිටියේ මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිකාරිය වූ අවලා ශානිකා සෙනෙවිරත්න පිළිබඳව කරුණු වාර්තා කිරිම නොකළ බවත්, අපරාධ වාර්තා කොට්ඨාශයේ නිලධාරින් විසින් ලබාගන්නා ලද වීඩියෝ පට පරික්ෂාවට පත් කිරිමේදි X ලෙස ලකුණු කර ලබාදුන් ලේඛනයේ දැක්වෙන කාන්තාව තමාගේ මතකයේ හැටියට අවලා සෙනෙවිරත්න ලෙස හදුනාගත් බවත්, ඒ මත ඇය පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කළ බවත් ය.

ඒ අනුව 01 වගඋත්තරකරු පැහැදිලිවම 2024.04.09 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාවේ පරික්ෂණයේදි නිතිඥ නානායක්කාර ගොඩකන්දේ අවලා ශානිකා සෙනෙවිරත්න නමින් හෝ අංක 215, කනත්ත පාර, ඇලන්වත්ත, පන්නිපිටිය ලිපිනයේ සැකකාරියක සම්බන්ධයෙන් අධිකරණයේ කරුණු වාර්තා නොකල බවට 2024.04.09 දිනැති කොමිෂන් සභා පරීක්ෂණයේදී පිළිගෙන ඇත. අධිකරණයට කරුණු වාර්තා කළ අවලා සෙනෙවිරත්න යන සැකකාරිය කවුරුන්ද යන්න විමසිමේදි 01 වන වගඋත්තරකරු දක්වා සිටිනුයේ අපරාධ වාර්තා කොට්ඨාශයේ නිලධාරින් විසින් ලබාදුන් වීඩියෝ දර්ශන නැරඹීමේදි එම වීඩියෝ පටයේ 11.23.14 සටහන් වී ඇති කාලය තුළ හිසෙහි පලදින රතු හා කලු පැහැති හිස් වැසුමක් හිසෙන් ගලවා ආසන්නයේ සිටින රංගන ශිල්පිනියක වන දිපානි සිල්වා යන අයට තොප්පියක් පලදවන කාන්තාව අවලා සෙනෙවිරත්න බවට හඳුනා ගත් බවයි.

ඒ පිළිබඳව වැලිකඩ පොලිස් ස්ථානයේ සුලු පැමිණිලි තොරතුරුපොතේ 2024.01.21 පැය 22.10 (Page Para 211/255) සටහන් යොදා ඇති බවත් දක්වා ඇති අතර, අදාළ ලේඛන පරීක්ෂාවේදි එවැනි සටහනක් ඇති බව නිරීක්ෂණය වේ.

කොමිෂන් සභාවේ පැවැති පරික්ෂණයේදි එම කාන්තාව අවලා සෙනෙවිරත්න බවට කරුණු දැක්වුයේ කුමන සාධාරණ පදනමක් මතද යන්න පිළිබද විමසිමේදි 01 වන වගඋත්තරකරු කොමිෂන් සභාවට ඉදිරිපත් කළ ඡායාරූපයේ සදහන් තැනැත්තිය අවලා සෙනෙවිරත්න යන නමින් තමාගේ මතකයේ ඇති බැවින් එලෙස අධිකරණයට කරුණු වාර්තා කළ බව වගඋත්තරකරු විසින් දක්වා ඇත.

01 වන වගඋත්තරකරු අධිකරණයට කරුණු වාර්තා කිරිමට පෙර අපරාධ වාර්තා කොට්ඨාශයේ නිලධාරින් වෙතින් ලබාගත් වීඩියෝ දර්ශන පිටපත් පරීක්ෂා කර සැකකාරිය හඳුනා ගත් බවට සුලු පැමිණිලි අංශයේ MOIB 211/255 යටතේ සටහන් යොදා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවට ලබාදි ඇති ලේඛන පරීක්ෂා කිරීමේදි අපරාධ වාර්තා කෙට්ඨාශයේ නිලධාරීන් ලබාදෙන ලද වීඩියෝ දර්ශන ඇතුලත් සිඩි තැටි ලබාදි ඇත්තේ 2024.02.18 දින බව තොරතුරු සටහන් පොතේ 2024.02.18 පැය 14.50 ට 283/4769 සටහන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව එම කොට්ඨාශය භාරව ඇති දර්ශන 2024.01.21 දින නැරඹූ බවට දක්වන කරුණු පිළිබඳ ගැටලුවක් ඇති බව කොමිෂන් සභාවේ අවධානයට යොමු වේ.

එසේම 01 වන වගඋත්තරකරු පරීක්ෂණයේදි දැක්වූ පරිදි විඩියෝ දර්ශනවල සිටි කාන්තාවක් අවලා සෙනෙවිරත්න යන අය බව නම මතකයේ තිබූ බව දක්වා කිසිදු විමර්ශනයකින් තොරව අධිකරණයට කරුණු වාර්තා කිරීම ප්‍රශ්න සහගත වේ.

1979 අංක 15 දරණ අපරාධ නඩු විවිධාන 116 (1) වගන්තිය ප්‍රකාරව දක්වා ඇත්තේ "ප්‍රමාණවත් තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම් වී තිබේ නම් හෝ වැඩිදුර විමර්ශනය කිරීම අවශ්‍ය නම් එකී කාරණය මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීම නිලධාරියෙකුගේ හෝ පරීක්ෂකයෙකුගේ කාර්ය වන බව යි.

එසේම පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක සී 1හි වරදකරුවන්ට නඩු පැමිණිලි කිරීම යටතේ දක්වා ඇත්තේ සෑම පරීක්ෂණයක්ම අප්‍රමාදව සම්පූර්ණ කළ යුතුය යන නීතියේ නියමයයි. එසේම අපරාධ පරීක්ෂණයක සම්පූර්ණ අරමුණ වන්නේ සත්‍ය කරුණු සනාථ කොට ගෙන එම කරුණු උසාවියකට ඉදිරිපත් කිරීම බවද දක්වා ඇත.

එහිදි 01 වන වගඋත්තරකරු තම මතකයේ හැටියට සැකකරු හඳුනාගෙන අධිකරණයට කරුණු දැක්වීම තුළින් නිසි විමර්ශනයකින් යුතුව අධිකරණයට ඉදිරිපත් කිරීම සිදුවී නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ.

<u>වරගොඩ මුදලියේ ජෙරාඩ් මර්වින් පෙරේරා</u> එදිරිව <u>පො.ප සුරවීර වත්තල පොලිස් ස්ථානාධිපති ඇතුලු පිරිස</u> SCFR/328/2022 නඩුවේදී ද දක්වා තිබුණේ ජෙරාඩ් මර්වින් යන තැනැත්තා කවුද යන්න නිශ්චිතව තහවුරු කොට ගෙන අත්අඩංගුවට ගැනීම කළ යුතු බවයි. එසේම, <u>ගනේෂන් සැම්සන් රෝයි</u> එදිරිව <u>එම්.එම්.ජනක මාරසිංහ ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව</u> SCFR/TO5/2018 නඩුවේදි දක්වා තිබුණේ පැමිණිල්ල විශ්වාස කළ හැකිද නැතහොත් ලබාදී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නොවේ නම් අවශ්‍ය විමර්ශන සිදුකිරීමට පොලිස් නිලධාරියෙකු ක්‍රියාත්මක විය යුතු බවත්, සාමාන්‍ය හෝ නොපැහැදිලි සැකයක් මත අත්අඩංගුවට ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුද්ගලයෙකුට සහතික කර ඇති පුද්ගලික නිදහස් සැලකිය යුතු ලෙස සීමා කිරීමට තුඩුදෙනු ඇති බවත් ඒ තුළින් 13(1) සහ 12(1) ව්‍යවස්ථා උල්ලංඝනය වන බවත්ය.

**නිගමනය**

මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇති පරිදි අලුත්කඩේ මා/උ බි 5463/04/23 නඩුවෙහි චූදිත 07 ලෙස නම් කර ඇති "අවලා සෙනෙවිරත්න" යන අය පැමිණිලිකාරිය වන අංක 215, කහවත්ත පාර, ඇලන්වත්ත, පන්නිපිටිය යන ලිපිනයේ අවලා ශානිකා සෙනෙවිරත්න යන අය නොවන බවට 01 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇති අතර එම නඩුවට අදාළ "අවලා සෙනෙවිරත්න" යන තැනැත්තියට අදාළ ඡායාරූපයක් ද 01 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එසේ හෙයින් 01 වන වගඋත්තරකරු විසින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන අවලා ශානිකා සෙනෙවිරත්න යන අයව අත්අඩංගුවට ගැනීමේ සූදානමක් පවතින බවට නිරීක්ෂණය නොවන බැවින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමට නිරීක්ෂණය වීමේ අත්‍යාසන්නතාවයක් පවතින බවක් අනාවරණය නොවන බවට නිගමනය කරනු ලැබේ.

එසේවුවද, 01 වන වගඋත්තරකරු විසින් මා/උ බි 5463/04/23 නඩුවෙහි චූදිත 07 ලෙස "අවලා සෙනෙවිරත්න" යන අය නම් කර ඇත්තේ තමාගේ මතකයේ හැටියට අදාළ වීඩියෝ පටයේ සිටින තැනැත්තිය "අවලා සෙනෙවිරත්න" වන නිසා බවට කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කිරීමත්, එම තැනැත්තියගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් නිවරදි තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමත් හේතුවෙන් 01 වන වගඋත්තරකරු විසින් නිසි විමර්ශනයකින් තොරව "අවලා සෙනෙවිරත්න" යන නම ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, 01 වන වගඋත්තරකාර පොලිස් නිලධාරියාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් 02 වන වගඋත්තරකාර පාර්ශවය වෙත 2024.02.24 දිනැතිව සිදුකළ ලිඛිත පැමිණිල්ලට ද කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනිම තුළින් සාමාන්‍ය පුරවැසියෙකු ලෙස ශ්‍රී ලංකා පොලිසියේ ඉහල නිලධාරින්ට පැමිණිලි කිරීමේදී ඒ පිළිබඳව කටයුතු නොකිරිම තුළින් ද පැමිණිලිකාරිය අගතියට පත්ව ඇති බව නිරීක්ෂණය වේ.

**එසේහෙයින්,**

01. 01 වන වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසට පොලිස්පති වෙත නියම කරනු ලැබේ.

02. පොලිස්පතිවරයා විසින් සිවිල් පුරවැසියෙක් සිදුකරනු ලබන පැමිණිලි පිළිබඳ කඩිනමින් ක්‍රියාත්මක විමටත් ඒ පිළිබඳ කටයුතු වන ආකාරය පිළිබඳවත් පාරදෘශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරිම හා එම ක්‍රමවේදය පිළිබඳව මහජනයා තවදුරටත් දැනුම්වත් කිරීමටත් සුදුසු පියවර ගෙන ඒ සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුම්වත් කිරීමට ද කටයුතු කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

මෙකී නියමයන් ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස පොලිස්පති වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත - 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා

මහජන ආරක්ෂක අමාත්‍යාංශය,

4 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.